(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 6(3).]

# පාර්ලිමේන්තුවේ අංක 6 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2012 ජූලි මස 06 වැනි සිකුරාදා

## 2012 ජූලි මස 17 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

පරිසර අමාත්‍යතුමා,— සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ නියෝග,— 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 7 වැනි සහ 21 වැනි වගන්ති සමග කියවිය යුතු, එකී පනතේ 51 වැනි වගන්තිය යටතේ පරිසර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 ජනවාරි 19 දිනැති අංක 1741/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.07.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

## 2012 අගෝස්තු මස 07 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1329/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) මාතලේ දිස්ත්‍රික්කයේ, යටවත්ත, ගම්මුල්ල, හීං ඇළ පාලම ඉදිකිරීම සඳහා මීට වර්ෂ කිහිපයකට පෙර මුල් ගල් තැබූ බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාලම ඉදිකිරීම සඳහා,

(i) ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) මේ වනවිට වැය කර ඇති මුදල කොපමණද;

(iii) මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(iv) විදේශ ආධාර ලැබුණේ නම්, එය ප්‍රදානය කළ රට සහ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම පාලමෙහි ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පාලමේ ඉදිකිරීමේ කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(iv) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1380/'11

ගරු රවි කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලිය සඳහා ශ්‍රී ලංකාව සම සත්කාරක රටක් වන බව ලෝක කුසලාන ක්‍රිකට් කවුන්සිලය විසින් ශ්‍රී ලංකාව වෙත දැනුම් දෙනු ලැබූ දිනය කවරේද;

(ii) ලෝක කුසලාන තරඟ සඳහා දැනට පවතින ක්‍රිකට් ක්‍රීඩාංගන නවීකරණය සඳහා වියදම් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) දැනට පවතින ක්‍රිකට් ක්‍රීඩාංගන නවීකරණය සහ අලුතින් ක්‍රිකට් ක්‍රීඩාංගන ඉදිකිරීම සඳහා වන වියදම් අනුමත කිරීම පිණිස බලය පවරා දෙනු ලැබූ පුද්ගලයන්ගේ නම් කවරේද;

(iv) ක්‍රීඩාංගන ඉදිකිරීම් අනුමත වියදම්වලට අනුකූලව සිදු කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1870/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ අන්තර්ජාල හරහා ඇමතුම් අංශයේ (VOIP) දිනක ආදායම හා මාසික ආදායම කොපමණද;

(ii) එම අංශය මේ වන විට වසා දමා තිබේද;

(iii) එසේ නම්, වසා දමන ලද දිනය කවරේද;

(iv) එම අංශය වසා දැමීමට හේතු කවරේද;

(v) වසා දමන අවස්ථාවේ දී එම අංශය ලැබූ ලාභය හෝ අලාභය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2238/'12

ගරු පී. හැරිසන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) උතුරුමැද පළාත් සභාව වකුගඩු රෝගීන්ට නොමිලයේ බෙදා හැරීම සඳහා ප්‍රමිතියෙන් තොර ජල පෙරණ අක්‍රමවත් ලෙස මිලදී ගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එම ජල පෙරණ මිලදී ගැනීමේදී,

(i) වැය කළ මුදල හා ලබා ගත් ජල පෙරණ සංඛ්‍යාව;

(ii) අනුගමනය කළ ටෙන්ඩර් පටිපාටිය;

(iii) ටෙන්ඩර් ඉදිරිපත් කළ ආයතනවල නම්, ලිපිනයන් සහ ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන්;

(iv) ටෙන්ඩරය ලබාදුන් ආයතනයේ නම හා ලිපිනය;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් ජල පෙරණ,

(i) සම්බන්ධ ප්‍රමිති පරීක්ෂාව රජයේ ආයතනයකින් සිදු නොකර මිලදී ගත් ආයතනයෙන්ම සිදු කිරීමට අනුමතිය ලබා ගත් ක්‍රියා පටිපාටිය කවරේද;

(ii) බෙදාහැරීම නතර කරන ලෙස විගණකාධිපතිවරයා නියෝග කර තිබියදීත් තව දුරටත් ඒවා මිලදී ගන්නේද;

(iii) මිලදී ගැනීමට මුදල් අනුමත කළ නිලධාරියා කවුරුන්ද;

(iv) මිලදී ගැනීම රජයේ මුදල් රෙගුලාසිවලට පටහැනිව සිදුකර ඇති බව පිළිගන්නේද;

(v) මිලදී ගැනීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2248/'12

ගරු තිස්ස අත්තනායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 වර්ෂයේදී වාර්තා වූ රැකියා විරහිත උපාධිධාරීන්ගේ සංඛ්‍යාව, හදාරා ඇති උපාධි පාඨමාලාව අනුව හා එක් එක් පළාත අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය විසඳීම සඳහා 2011 වර්ෂය තුළ රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය විසඳීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඉදිරියේදී ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2284/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාත් දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය භාරදී ඇති සමාගම එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ලබාදී ඇති ඇස්තමේන්තුගත මුළු වටිනාකම කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය සහ අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා ඉන්දියානු ශ්‍රමිකයින් සේවයේ යෙදවීමට අදාළ ඉන්දියානු සමාගමට අවසර ලබාදී තිබේද;

(iv) එම සමාගම මගින් ඉන්දියානු රියදුරන්ට හා යන්ත්‍ර ක්‍රියාකරුවන්ට ගෙවන වැටුප කොපමණද;

(v) එම ව්‍යාපෘතියේ සේවය කරන ශ්‍රී ලාංකික රියදුරන්ට හා යන්ත්‍ර ක්‍රියාකරුවන්ට එම සමාගම ගෙවන වැටුප කොපමණද;

(vi) ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට ලබාදෙන අතිකාල පැය සංඛ්‍යාව කොපමණද;

(vii) ඉන්දියානු ශ්‍රමිකයන්ට සහ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට අතිකාල පැයකට ගෙවනු ලබන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතියේ සේවය කරන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට නවාතැන් පහසුකම්, සනීපාරක්ෂක පහසුකම් සහ ආරක්ෂිත උපකරණ ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම පහසුකම් ප්‍රමාණවත්ව ලබා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2300/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට අධ්‍යාපන අමාත්‍යාංශය සමග විවිධ කටයුතුවල නිරත වී සිටින රාජ්‍ය නොවන සංවිධාන කවරේද;

(ii) පසුගිය වර්ෂ දහයක කාලය තුළ වතුකරයේ සහ උතුරු නැගෙනහිර පළාත් හැර අනෙකුත් ප්‍රදේශවල විවිධ රාජ්‍ය නොවන ආයතන අධ්‍යාපන අමාත්‍යාංශය සමග ඒකාබද්ධව විවිධ ව්‍යාපෘති හා සංවර්ධන වැඩසටහන් යටතේ ඉටු කරන ලද කාර්යයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) උක්ත වැඩසටහන් යටතේ පසුගිය වර්ෂ දහය තුළ ඒ ඒ ආයතනය වෙතින් අධ්‍යාපන අමාත්‍යාංශයට ලැබුණු මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාරවල වටිනාකම වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2358/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නැගෙනහිර පළාතේ, ඔලුවිල් ප්‍රදේශයේ විශාල වශයෙන් මුහුදු ඛාදනය සිදුවන බව එතුමා දන්නෙහිද?

(ආ) එම තත්ත්වය වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2375/'12

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය පිහිටුවූ දින සිට මේ දක්වා ඒ යටතේ දේශීය හා විදේශීය අයෝජකයන් විසින් ආරම්භ කර ඇති ඇඟළුම් කම්හල් සංඛ්‍යාව කොපමණද;

(ii) එයින් මේ වන විට ක්‍රියාත්මක වන ඇඟළුම් කම්හල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම කම්හල්වල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආයෝජන මණ්ඩලය යටතේ ආරම්භ කර දැනට වැසී ගොස් ඇති කම්හල් සම්බන්ධයෙන් රජය ගෙන ඇති ක්‍රියාමාර්ගය කවරේද;

(ii) එම කම්හල් නැවත ආයෝජකයන්ට ලබාදීමට රජය අදහස් කරන්නේ නම්, ඒවායේ හිමිකම්, ණය බර, සේවක ප්‍රශ්න ආදිය පිළිබඳව රජය ලබා දෙන සහතිකය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2387/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ හිටපු සභාපති ලක්ෂ්මන් හිරිමුතුගොඩ මහතා විසින් 2007 වර්ෂයේදී බඳවා ගැනීමේ පටිපාටියක් සැකසුවේද;

(ii) ඊට විශේෂඥ දැනුමැති රාජ්‍ය නිලධාරීන් සහභාගී වූයේද;
(iii) එය ක්‍රියාත්මක කළේ නම්, එම දිනය කවරේද;
(iv) නොඑසේ නම්, ඊට පටහැනිවූ බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කළේද;
(v) එහි ඇතුළත් තනතුරු හා අදාළ සුදුසුකම් කවරේද;
(vi) ඊට අනුමතිය දුන් අය හා එය සැකසූ අය කවුරුන්ද:
(vii) එම අනුමතිය ලබා දීමට අදාළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ වගන්තිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත අ (iv) පරිදි සැකසූ බඳවා ගැනීමේ පටිපාටිය,

(i) කොමිෂන් සභාවට ඉදිරිපත් කළේද;
(ii) ඉදිරිපත් නොකළේ නම්, ඒ මන්ද;
(iii) ඒ සම්බන්ධයෙන් ජාතික වැටුප් කොමිසම සමග එකඟතාවන්ට එළැඹුණේද;
(iv) ඒ සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අනුමතිය ලැබුණේ නම්, එය ලබාගත් නිලධාරියා සහ දිනය කවරේද ;
(v) ඉහත (ආ) (iii) හි එකඟවීම ලිඛිතව ඉදිරිපත් කර තිබේද;
(vi) ජාතික වැටුප් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට පෙර විෂය භාර අමාත්‍යවරයාට ඉදිරිපත් නොකළේ නම්, ඒ මන්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1601/'11

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004.01.01 දින සිට අද දක්වා වූ කාලය තුළ අධිචෝදනා ගොනුකිරීමෙන් පසුව නීතිපතිවරයා විසින් ඉල්ලා අස්කරගෙන ඇති නඩු සංඛ්‍යාව කොපමණද;
(ii) එලෙස අධිචෝදනා ඉදිරිපත් කරන ලද නඩුවල සහ පුද්ගලයන්ගේ නම් සහ එම අධිචෝදනාපත්‍ර භාරදුන් දිනයන් කවරේද;
(iii) එලෙස අධිචෝදනාපත්‍ර භාරදීමෙන් අනතුරුව ඒවා ඉල්ලා අස්කර ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) භාරදුන් අධිචෝදනාපත්‍රයක් ඉල්ලා අස්කර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් දරන ලද වියදම කොපමණද;
(ii) ඒ සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන්ගේ නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1827/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, හොරොව්පතාන පිහිටි මහාමාර්ග දෙපාර්තමේන්තුවට අයත් කාර්යාල ගොඩනැගිල්ල වර්ෂ ගණනාවක සිට විනාශවෙමින් පවතින බවත්;

(ii) එම රජයේ ගොඩනැගිල්ල එලෙස විනාශයට පත්වීමට ඉඩ හැරීම ජාතික අපරාධයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර ඵලදායී ආර්ථික කටයුත්තක් සඳහා යොදා ගැනීමේ සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, එම ආර්ථික කටයුත්ත කවරේද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ වෙන් කර ඇති මුදල කොපමණද;

(v) එම ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2117/’11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පඬුවස්නුවර, මගුලාගම - කටුපොත මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) ප්‍රතිසංස්කරණය කරනු ලබන එම මාර්ගයේ දිග හා පළල කොපමණද;

(iii) එම දුර ප්‍රමාණය තුළ ඇති පාලම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ලැබුණු ටෙන්ඩර් අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ටෙන්ඩර් අයදුම්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම ටෙන්ඩරය ප්‍රදානය කරනු ලැබූ ආයතනයේ නම කුමක්ද;

(v) එම ආයතනය ඉදිරිපත් කළ ටෙන්ඩරයේ වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එකී මාර්ගයේ වැඩ අවසන් කරන දිනය කවරේද;

(ii) වැඩ අවසන් කරන අවස්ථාවේදී වැය වේයැයි අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2307/’12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පාසල් උපදේශන හා වෘත්තීය මාර්ගෝපදේශන ඒකක මගින් පාසල් පද්ධතිය තුළ ඉටුකරන කාර්යභාරය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විධිමත් ආකාරයේ උපදේශන සහ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයක් පවත්වාගෙන යනු ලබන රජයේ පාසල් සංඛ්‍යාව;

(ii) එම පාසල්වල සේවය කරන විධිමත් පුහුණුවක් ලැබූ උපදේශකවරුන් සංඛ්‍යාව;

කවරේද යන්න දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2376/'12

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වසා දමන ලද කම්හල් හා ව්‍යාපාරික ආයතන 25ක් සඳහා ආයෝජනය කිරීමට ඉල්ලුම්පත් කැඳවා 2011 දෙසැම්බර් මස මුල් සතියේදී පළ කරන ලද දැන්වීමට ආයෝජකයන්ගෙන් ප්‍රතිචාර ලැබී තිබේද;

(ii) එම ව්‍යාපෘති යෝජනා සම්බන්ධයෙන් රජය මේ වන විට ගෙන ඇති පියවර කවරේද;

(iii) එම ව්‍යාපෘති ආරම්භ කිරීමේදී ආයෝජකයන්ට දෙනු ලබන සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 අගෝස්තු මස 08 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1381/'11

ගරු රවි කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 පෙබරවාරි 19 වැනි දින සහ අප්‍රේල් 2 වැනි දින අතරතුරදී පවත්වන ලද ලෝක කුසලාන තරඟවලින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ලැබූ ලාභය හෝ පාඩුව කොපමණද;

(ii) ප්‍රධාන ආදායම් මාර්ග සහ උපයන ලද මුළු ආදායම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) තරඟ පැවැත්වීමේදී සිදු කරන ලද ප්‍රධාන වියදම් කවරේද;

(iv) නිසි ටෙන්ඩර් පටිපාටින් අනුගමනය කිරීමෙන් සහ තරඟකාරී මිල ගණන් ඇගයීමට ලක් කිරීමෙන් පසුව එම වියදම් සිදු කරනු ලැබුවේද;

(v) නොඑසේ නම්, එම වියදම් සිදු කරන ලද ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ලෝක කුසලාන තරඟ සඳහා ප්‍රසාද ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එවැනි ප්‍රවේශපත්‍ර නිකුත් කරන ලැබූ පුද්ගලයන්ගේ නම් කවරේද;

(iii) නිකුත් කරන ලද ප්‍රසාද ප්‍රවේශපත්‍රවල වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1586/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, සිරිසමන්පුර, ඇරවක්ඔය හරහා ඇති හීන්දෙණියාවල පාලමේ ඉදිකිරීම් කටයුතු අතරමග නැවතී වර්ෂ ගණනාවක් ගතවී ඇති බවත්;

(ii) මේ නිසා ගම්මාන රැසක ජනතාව දැඩි අපහසුතාවයකට මුහුණ පාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) එහි ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රතිපාදන ලබාදෙන ආයතනය හෝ ආයතන කවරේද;

(iii) හීන්දෙණියාවල පාලමේ ඉදිකිරීම් කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(v) එම එක් එක් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(vi) ටෙන්ඩර් පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාලමේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දැමීමට හේතු කවරේද;

(ii) මෙම පාලම ඉදිකිරීමට අවශ්‍ය කටයුතු කරන්නේද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, එම මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1871/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යාපනයේ පිහිටි ටෙලිකොම් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය සඳහා ඇස්තමේන්තු කළ මුදල කොපමණද;

(ii) එම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේ නම්, ඒ සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කළ අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ටෙන්ඩර් පටිපාටිය අනුව අඩුම මිල ගණන් යටතේ ඉල්ලුම් පත් යොමු කළ අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එකී ටෙන්ඩරය ලබා දුන් පුද්ගලයාගේ හෝ ආයතනයේ නම සහ ටෙන්ඩරය ලබා දුන් මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට එකී ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා දරන ලද සමස්ත පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1925/'11

ගරු අජිත් පී. පෙරේරා මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2008, 2009 සහ 2010 වර්ෂ තුළ ගෘහ සේවිකාවන් ලෙස විදේශගත වූ කාන්තාවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් වර්ෂවලදී ගෘහ සේවිකාවන් ලෙස විදේශගත වී ඇති කාන්තාවන් අතර සිටි මව්වරුන් පිළිබඳව සංඛ්‍යා ලේඛන විදේශ රැකියා නියුක්ති කාර්යාංශය සතුව තිබේද;

(iii) එසේ නම්, ගෘහ සේවිකාවන් ලෙස විදේශගතවූ මව්වරුන් සංඛ්‍යාව එක් එක් වර්ෂය, අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මව්වරුන් විදේශගත වීම, ඔවුන්ගේ පවුල්වල දරුවන්ට අගතිදායක ලෙස බලපාන බවත්;

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27(12) ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේදී පවුල් ඒකක ආරක්ෂා කිරීම සඳහා රජය වෙත විශේෂ වගකීමක් පැවරී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, දරුවන් සිටින කාන්තාවන් ගෘහ සේවිකාවන් ලෙස විදේශගත වීම නතර කිරීමට රජය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2286/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (VIII) අනුව හා 2006 අයවැයේ යෝජිත පරිදි ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හා ශ්‍රී ලංකා ගුරු සේවයේ හිඟ වැටුප් ගෙවීම ප්‍රමාද වී තිබේද;

(ii) එසේ නම්, ප්‍රමාද වී ඇති කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2012 අයවැය මගින්ද 2005. 12. 31 දිනෙන් පසුව විශ්‍රාම ගිය විදුහල්පති හා ගුරු සේවයේ අය සඳහා ජීවන වියදම් දීමනාව වැඩිකර නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ඉහත සියලු ආකාරයන්ගෙන් අපහසුතාවට පත්ව ඇති විශ්‍රාම ගිය විදුහල්පති හා ගුරු සේවයේ නියුක්තවූවන්ට දෙන සහනයන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2305/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශය සතු ඉඩම් හෝ ගොඩනැගිලි මේ වනවිට කුලියට හෝ බද්දට දී තිබේද;

(ii) එසේ නම්, එම ගොඩනැගිලි හෝ ඉඩම් බදු දී ඇති කාල සීමාව කවරේද;

(iii) ඒ මගින් අමාත්‍යාංශය උපයන වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2377/'12

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට බලපවත්වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතට අනුව ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම් අත්සන් කර ඇති කර්මාන්ත හෝ ආයතන, අදාළ ආයෝජකයන්ට නිසි දැනුම්දීමකින් තොරව රජයට පවරාගත හැකිද;

(ii) එසේ නම්, එවැනි පවරාගැනීම් කළ හැකිවීමට ඉඩ ලබා දෙන ආයෝජන මණ්ඩලය සමග එළැඹි ගිවිසුමේ ඇතුළත් කොන්දේසි කවරේද;

(iii) අයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට බැඳී ඇති, එහෙත් රජයට පවරාගත් යම් ආයතන ඇත්නම්, ඒ පිළිබඳව ආයෝජන මණ්ඩලය ගන්නා ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2611/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මතුගම අධ්‍යාපන කලාපයට අයත්, කලු/ගලේවත්ත දෙමළ විදුහල සතු ඉඩමේ මායිම් සලකුණු කර වැටක් ඉදිකළ යුතු බවට එම පාසලේ සිසු දරුවන්ගේ දෙමව්පියන් විසින් ඉල්ලීමක් ඉදිරිපත්කර ඇති බවත්;

(ii) අගලවත්ත "ඩොක්කීඩ්" වත්තේ ජීවත්වන දරුවන්ගේ යහපත උදෙසා පාසලක් ඉදිකර දෙන ලෙස එම ප්‍රදේශයේ ජනතාව විසින් ඉල්ලීමක් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අ(i) සහ (ii) යටතේ වූ ඉල්ලීම් සපුරා දීමටත්;

(ii) කලු/ගලේවත්ත දෙමළ විදුහලේ සිසුන්ගේ සහ ගුරුවරුන්ගේ පරිහරණය සඳහා අවශ්‍ය වැසිකිළි පද්ධතියක් ඉදිකිරීමටත්;

(iii) එම විදුහලට ක්‍රීඩා පිට්ටනියක් ඉදිකරදීමටත්;

පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1708/'11

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වන විට ඇති සියලුම ලියාපදිංචි දේශපාලන පක්ෂවල නම් කවරේද;

(ii) ඉහත සඳහන් දේශපාලන පක්ෂවල නිලධාරීන් ලෙස කටයුතු කරන පුද්ගලයන්ගේ නම් කවරේද;

(iii) ලියාපදිංචි දේශපාලන පක්ෂවල ගිණුම් වාර්ෂික පදනමින් ලබාදී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ලියාපදිංචි කරන අවස්ථාවේදී තිබිය යුතු කොන්දේසි සපුරා නොතිබීම හේතුවෙන් ලියාපදිංචිය අවලංගු කරන ලද දේශපාලන පක්ෂවල නම් කවරේද යන්නත්;

(ii) මැතිවරණ කොමිසමෙන් හෝ මැතිවරණ කොමසාරිස්වරයාගේ කාර්යාලයෙන් ඉකුත් වසර තුනක කාලය තුළ, එක් එක් වර්ෂයේදී එම එක් එක් දේශපාලන පක්ෂය වෙත ලැබුණ මුදල් ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1828/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ මේ වන විට විශාල පුරප්පාඩු ප්‍රමාණයක් පවතින බවත්;

(ii) 2006 වර්ෂයේදී තැපැල් දෙපාර්තමේන්තුවට තැපැල් නිලධාරීන් බඳවා ගැනීමේ තරඟ විභාගය සඳහා ඉල්ලුම්පත් කැඳවූ බවත්;

(iii) එම තරඟ විභාගය 2007 වර්ෂයේදී පවත්වා 2008 වර්ෂයේදී ප්‍රතිඵල නිකුත් කර ඇති බවත්;

(iv) එම ප්‍රතිඵල අනුව මෙතෙක් බඳවා ගැනීම් සිදුකර නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) 2008 වර්ෂයේ නිකුත් කළ විභාග ප්‍රතිඵල අනුව අදාළ බඳවා ගැනීම් සිදු නොකිරීමට හේතු කවරේද;

(ii) එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2118/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2000.12.06 සහ 2001.04.19 අතර කාලය තුළ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සංයුක්ත ජාලයක් සකස් කිරීම සඳහා David N Town Send & Associates ආයතනයට කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබේද;

(ii) එම සංයුක්ත සැලැස්ම සැකසීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබුණේද;

(iii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කළ පාර්ශ්වයන්ගේ නම්, ලිපිනයන් සහ එක් එක් ටෙන්ඩර්කරු ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) කොන්ත්‍රාත්තුව ලබා දුන් මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කොන්ත්‍රාත්තුව ලබා දුන් ආයතනයට ඒ සඳහා ඉදිරිපත්වීමට තිබූ සුදුසුකම් කවරේද;

(ii) එම කොන්ත්‍රාත්තුව ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය ලබා දී තිබුණේද;

(iii) එම ආයතනය විසින් පිළිගත හැකි සංයුක්ත සැලැස්මක් ඉදිරිපත් කළේද;

(iv) නොඑසේ නම්, ඒ සඳහා වියදම් වූ මුදල කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කරන්නේද;

(v) ඒ සම්බන්ධයෙන් දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2289/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 උසස් පෙළ ප්‍රතිඵල නැවත ඇගයීම සඳහා ලැබුණු මුළු අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

(ii) 2011 උසස් පෙළ විභාගය සඳහා (පැරණි හා නව නිර්දේශ යටතේ) ඉදිරිපත් වූ මුළු සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේදී ඇති වූ දිස්ත්‍රික් පංගු (quota) සහ ඉසෙඩ් (Z) අගයන් දැක්වීමේදී ඇති වූ දෝෂ නිවැරදි කර තිබේද;

(iv) ඉහත විභාගයේ සමහර විෂයයන් සඳහා ප්‍රතිඵල ලබාදීම කල්ගත වීමට හේතු කවරේද;

(v) සමහර විෂයයන් සඳහා ප්‍රතිඵල ලබාදීමට ප්‍රථම ඉසෙඩ් අගය හා දිස්ත්‍රික් පංගු අගයන් ප්‍රකාශ කළ ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උසස් පෙළ ප්‍රතිඵල සම්බන්ධයෙන් මේ වන විට සිසුන් හා ජනතාව අතර විශ්වාසය බිඳ වැටී ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2308/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2002 සිට 2012 දක්වා පාසල් සිසුන් සඳහා නිකුත්කර ඇති දුම්රිය හා බස්රථ සඳහා වූ වාර ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාව වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා එක් එක් වර්ෂයේදී දරා ඇති වියදම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2378/'12

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සංවර්ධනය උදෙසා හා ජාත්‍යන්තරව ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට හානි කරනු ලබන විදේශීය බලපෑම් අවම කරවීමට අවශ්‍ය අන්තර්ජාතික සහයෝගය ලබා ගැනීමට හිතකර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා වැඩි දියුණුකිරීමේ අරමුණින් 2011 වර්ෂයේදී රජය විසින් සිදු කරන ලද විදේශ ගමන් කවරේද;

(ii) එම විදේශ සංචාර සඳහා සහභාගීවූවන් කවුරුන්ද;

(iii) ඒ වෙනුවෙන් වැයවූ මුදල කොපමණද;

(iv) එම විදේශ සංචාර නිසා ශ්‍රී ලංකාවට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම් මන්ද?

1850/'11

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ, එක් එක් වර්ෂයේදී, එක් එක් වරායට අදාළව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විශාලතම පිරිවැය ඉහළයාම් 10 සිදුවූයේ කවර කාර්යයන් සඳහාද;

(ii) ඉහත (i) හි සඳහන් පිරිවැය තීරණය කිරීමේදී සියලුම සාධක එක්ව සැලසීම මගින් ඇතිවූ ඒකාබද්ධ සමස්ත බලපෑම කවරේද;

(iii) පිරිවැය වැඩිවීමට සමානුපාතිකව ආදායමේ වැඩිවීමක් සිදුවී තිබේද;

(iv) නොඑසේ නම්, එම මූල්‍ය හිඟය පියවාගත් ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ 6ක කාලය තුළ එක් එක් වර්ෂයේදී, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ එක් සේවකයෙකු වෙනුවෙන් වූ අයභාරය, පිරිවැය, ලාභය සහ අගය එකතු කිරීම කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2012 අගෝස්තු මස 09 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1382/’11

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂයේ සහ 2011 වර්ෂයේ මේ දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකා ක්‍රිකට් සංචිතයේ ක්‍රිකට් ක්‍රීඩකයන් වෙත වාර්ෂිකව ගෙවන ලද මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගෙවීම් තීරණය කිරීම සඳහා යොදා ගත් නිර්ණායකය කවරේද;

(iii) එම නිර්ණායකය සකස්කළ පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ක්‍රිකට් කණ්ඩායම තේරීමේ පූර්ණ වගකීම තේරීම් කමිටුව සතු වන්නේද;

(ii) නොඑසේ නම්, එකී වගකීම දරන වෙනත් අය සිටින්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ එම කමිටුවේ සේවය කළ සාමාජිකයින්ගේ නම් කවරේද;

(ii) ඔවුන්ට යම් ගෙවීමක් කළේද;

(iii) එසේ නම්, කිනම් හෝ ආකාරයකින් ඔවුන්ට ගෙවූ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1590/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල පැවති දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන යටතේ කුඹුක්කන, ඔක්කම්පිටිය, බුත්තල සහ සෙල්ලකතරගම යන මාර්ග කාපට් කර සකස් කළ බවත්;

(ii) එම මාර්ගවලින් කිහිපයක් මේ වනවිට ගිලා බැස ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම එක් එක් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) එම ප්‍රතිපාදන සපයන ලද දේශීය හෝ විදේශීය ආයතනය හෝ ආයතන කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ග සංවර්ධන කටයුතු භාරදුන් කොන්ත්‍රාත්කරු/කොන්ත්‍රාත්කරුවන් කවුරුන්ද;

(ii) එම කටයුතු අධීක්ෂණය කරන ලද ආයතනය කවරේද;

(iii) එම මාර්ගයන්හි අබලන්ව ඇති ස්ථාන එම කොන්ත්‍රාත්කරුවන් මගින් නැවත ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1903/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කාල්ටන් ක්‍රීඩා නාලිකාවේ (CSN) අයිතිය රජය හෝ රජය අනුබද්ධ ආයතනයක් සතුවන්නේද;

(ii) එහි අයිතිය පෞද්ගලික ආයතනයක් සතු නම්, එම ආයතනයේ හිමිකරු හෝ හිමිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කාල්ටන් ක්‍රීඩා නාලිකාවේ විකාශන කටයුතු ආරම්භ කළ දිනය හෝ ආරම්භ කිරීමට නියමිත දිනය කවරේද;

(ii) එම නාලිකාව ආරම්භ කිරීමට වෙන් කළ තරංග පරාසයන් (frequency range) කවරේද;

(iii) කාල්ටන් ක්‍රීඩා නාලිකාවට විකාශන අයිතිය ලබා දෙන ලද්දේ කවර කාලසීමාවක් සඳහාද;

(iv) එම නාලිකාව ආරම්භ කිරීමට අනුමතිය ලබා දුන් ලේඛන සහ විකාශන අයිතිය ලබා දීමට අදාළ ගිවිසුම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම නාලිකාව ආරම්භ කිරීම සඳහා ගෙවන ලද මුදල කොපමණද;

(ii) එම ගෙවීමට අදාළ ලේඛන ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2291/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළාත් පාලන ආයතන මගින් පාලනය වන පෙරපාසල්වල පාලිකා තනතුරු වෙනස් කිරීමට තීරණයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, එයට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළාත් පාලන ආයතන යටතේ ඇති පෙරපාසල්වල පාලනය වෙනත් ආයතනයන්ට මාරුකර තිබේද;

(ii) එසේ පාලනය මාරු කර ඇති පෙරපාසල් කවරේද;

(iii) එම ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අංක ඩීඑම්එස්/ඩී3/97/27/02 දරන ලිපිය මගින් අලුතින් පෙරපාසල් පාලිකා තනතුරු අනුමත නොකිරීමට ගෙන ඇති තීරණය පළාත් පාලන ආයතනවලින් පාලනය වන පෙරපාසල් වැසීයාමට හේතුවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2312/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ශ්‍රී ලංකාව තුළ රජයේ අනුමතිය ඇතිව ක්‍රියාත්මක වන විදේශීය විශ්වවිද්‍යාලවලට අනුබද්ධව උපාධි සහ පශ්චාත් උපාධි පිරිනමන පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනයේ නම, ලිපිනය, දුරකථන අංකය සහ ලියාපදිංචි වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ආයතනවල ප්‍රමිතිය අධීක්ෂණය කරන රජයේ ආයතනය කවරේද;

(iv) අවසන්වරට ප්‍රමිති අධීක්ෂණයක් සිදුකළ ලද වර්ෂය සහ එම ප්‍රමිති අධීක්ෂණයට ලක්වූ උසස් අධ්‍යාපන ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ අනුමතිය නොමැතිව මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක උපාධි සහ පශ්චාත් උපාධි පිරිනමන පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන ලියාපදිංචිය ලබාගත යුතු ආයතනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වර්ෂ 2000 සිට 2010 දක්වා උසස් අධ්‍යාපනය සඳහා විදේශගත වී ඇති ශ්‍රී ලාංකික සිසුන් සංඛ්‍යාව හා විදේශ රටවලින් ශ්‍රී ලංකාවට සංක්‍රමණය වී ඇති සිසුන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2379/'12

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් දැනට වර්ෂ අටකට පමණ පෙර සිට ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉලෙක්ට්‍රොනික ජාතික හැඳුනුම්පත් (e NIC) ව්‍යාපෘතියෙහි වත්මන් තත්ත්වය කවරේද;

(ii) ඒ සඳහා මේ වන විට ටෙන්ඩර් කැඳවීම් කරන ලද වාර ගණන කොපමණද;

(iii) එම ටෙන්ඩර් කැඳවීම් ක්‍රියාත්මක නොවීමට හේතු කවරේද;

(iv) මේ වන විට සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගෙන තිබේද;

(v) එම සැපයුම්කරු තෝරා ගැනීම ටෙන්ඩර් කැඳවීමක් තුළින් සිදු කළේද;

(vi) එසේ නම්, ඒ සඳහා අයදුම්කළ අනෙකුත් ටෙන්ඩර්කරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1829/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය අධ්‍යාපන කාර්යාලයට අයත්, මොරවක, කොටපොල හා පස්ගොඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවලින් පාලනය වන රජයේ පාසල්වල දුෂ්කර සේවා කාලය අවසන්වීමෙන් පසු ස්ථාන මාරුවීම් නොලැබීම නිසා දැඩි කලකිරීමට පත් විශාල ගුරු පිරිසක් සිටින බවත්;

(ii) මෙම හේතුව නිසා එම ගුරුවරුන්ගේ ඉගැන්වීමේ කටයුතුවල ගුණාත්මකභාවය පිරිහීමට ලක් විය හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ගුරු මාරු මණ්ඩල තීරණයන්ට අනුව ස්ථාන මාරු සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් කවරේද;

(ii) මේ වන විට ඉහත අධ්‍යාපන කලාප තුළ දුෂ්කර සේවා කාලය අවසන්වීමෙන් පසු ස්ථාන මාරුවීම් ඉල්ලා ඇති ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ට ස්ථාන මාරුවීම් ලබා දීම සඳහා වැඩ පිළිවෙළක් සකසා තිබේද;

(iv) එම ක්‍රමවේදය කවරේද;

(v) ඒ අනුව ස්ථාන මාරු ලබා දෙන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1851/'11

ගරු රවි කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 ක්‍රිකට් ලෝක කුසලාන තරඟාවලිය සඳහා අවශ්‍ය වූ ක්‍රීඩාංගණ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා තෝරාගත් ක්‍රීඩාංගණවල නම් කවරේද;

(iii) එම ක්‍රීඩාංගන තෝරා ගැනීම සඳහා යොදාගත් නිර්ණායක කවරේද;

(iv) ජාත්‍යන්තර ක්‍රිකට් ආයතනය (ICC) විසින් ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ලෝක කුසලාන තරඟාවලිය සඳහා අවශ්‍ය ක්‍රීඩාංගණ සංඛ්‍යාව දැනුම්දුන් දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ දිනය කවරේද;

(ii) ගෘහ නිර්මාණ ශිල්පී සුරත් වික්‍රමසිංහ මහතා විසින් ඇස්තමේන්තු කරන ලද එම ක්‍රීඩාංගණයේ මූලික ඉදිකිරීම් පිරිවැය සහ ඉදිකිරීම් අවසානයේ දරන ලද තථ්‍ය පිරිවැය කවරේද;

(iii) අවසාන පිරිවැයේ විශාල වර්ධනයක් සිදු වීමට හේතුව කවරේද; සහ

(iv) වික්‍රමසිංහ මහතාට හෝ වෙනත් අයකුට ගෘහ නිර්මාණ ශිල්ප කටයුතු ඉතා හොඳින් සිදුකළ හැකිව තිබියදී ඉන්දියානු ගෘහ නිර්මාණ ශිල්පියකු අවශ්‍ය වීමට හේතුව කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA) ක්‍රිකට් ක්‍රීඩාංගණ ඉදිකිරීම කෙරෙහි සම්බන්ධවීමට හේතු කවරේද; සහ

(ii) එසේ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට කිසියම් බලයක් පැවරී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2119/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කන්තලේ සීනි සමාගම වසා දැමූ දිනය කවරේද;

(ii) එතැන් සිට මේ දක්වා ලැබූ පාඩුව කවරේද;

(iii) එම කාල සීමාවේදී රජය විසින් එම සමාගමට ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iv) එම සමාගමේ වාර්ෂික නිෂ්පාදන ධාරිතාවය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කන්තලේ සීනි කම්හල බදු දීමට අදාළ බදු ගිවිසුම සභාගත කරන්නේද;

(ii) විදේශීය සමාගමක් වෙත බදු දුන්නේ නම් ඊට, එහි අතරමැදියා ලෙස කටයුතු කළ අයගේ නම සහ ලිපිනය කවරේද;

(iii) බදු පදනම මත ඉහත කම්හල ලබා ගැනීම සඳහා ඉදිරිපත් වූ අනෙකුත් ආයතනවල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කන්තලේ සීනි කම්හල සතු යන්ත්‍රවල වටිනාකම කොපමණද;

(ii) එම යන්ත්‍ර බදු ගිවිසුමට අදාළ වේද;

(iii) නොඑසේ නම්, එකී යන්ත්‍ර කුමක් සඳහා යොදාගනු ලැබූවේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2380/'12

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 නොවැම්බර් මස 24 දින එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ දූත පිරිසක් සහ ශ්‍රී ලංකා රජය අතර ඇති කර ගත් වාණිජ ගිවිසුම් කවරේද;

(ii) එම ගිවිසුම්වලට අනුව මේ වනවිට කර්මාන්ත හා වෙනත් ව්‍යාපාරික කටයුතු සඳහා මුදල් ආයෝජනය කිරීමට ඉදිරිපත්ව සිටින එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ආයෝජකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් ආයෝජන සිදුකිරීමට අපේක්ෂිත ක්ෂේත්‍ර සහ ඒවාට අදාළ අයෝජනයන්හි වටිනාකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ආයෝජකයින් වෙනුවෙන් විශේෂ සහන ලබාදී / කොන්දේසි පනවා තිබේද;

(v) එසේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1830/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ ගංවතුර වැළැක්වීම සඳහා නිල්වලා යෝජනා ක්‍රමය යටතේ ඉදිකොට ඇති සියලු ඉදිකිරීම් විනාශවීමේ අවදානමකට ලක්ව ඇති බවත්;

(ii) මේ නිසා සුන්දර කිරල කැලයද විනාශවීමේ තර්ජනයකට මුහුණපා ඇති බවත්;

(iii) ගංවතුර තර්ජනයක් ඇති විය හැකි නිසා ගොවීන් දැඩි අර්බුදකාරී තත්ත්වයකට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නිල්වලා යෝජනා ක්‍රමය යටතේ ඉදිකර ඇති ඇළ මාර්ග සහ ඉදිකිරීම් කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1852/'11

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පී. සරවනමුත්තු ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීමෙන් පසු කොපමණ කාලයකට පසුව එය ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩා තරඟ පැවැත්වෙන මට්ටමට පත්වන්නේදැයි එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පී. සරවනමුත්තු ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීම සඳහා ද්‍රවිඩ සංගම් ක්‍රිකට් සමාජය විසින් මිලක් ඉදිරිපත් කර තිබූ බවත්;

(ii) ඒ අනුව ආසන 25,000ක් සහිතව එම ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීම සඳහා වැයවන මුදල රුපියල් මිලියන 780ක් වූ බවත්;

(iii) එම යෝජනාව ප්‍රතික්ෂේප කළ ශ්‍රී ලංකන් ක්‍රිකට් ආයතනය එම කරුණ සඳහාම ඊට වැඩි මිලකට ඉදිරිපත්වූ විකල්ප යෝජනා පිළිගෙන ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) පී. සරවනමුත්තු ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීම සඳහා ද්‍රවිඩ සංගම් ක්‍රිකට් ක්‍රීඩා සමාජය විසින් ඉදිරිපත් කළ යෝජනාව ප්‍රතික්ෂේප කිරීමට හේතුව කවරේද;

(ii) පිළිගත් අනෙකුත් යෝජනාවල සඳහන් මිල ගණන් කවරේද;

(iii) විකල්ප මිල ගණන් සඳහන් යෝජනා පිළිගැනීමට බලපෑ හේතූන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2120/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2001 සිට 2004 දක්වා ඇඹිලිපිටිය කඩදාසි කම්හල ලැබූ ලාභය හෝ අලාභය කවරේද;

(ii) 2005 වර්ෂයේ සිට එම කම්හලේ සේවක වැටුප් ගෙවීමට වාර්ෂිකව රජය විසින් වෙන් කළ ප්‍රතිපාදන වෙන්වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කම්හල උපායමාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනයට (SEMA) පැවරූ දිනය කවරේද;

(ii) SEMA ආයතනයට පැවරීමෙන් පසු එම කම්හල සඳහා රජයෙන් හෝ වෙනත් මාර්ගවලින් වියදම් කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම කම්හල තිස් අවුරුදු බදු පදනම යටතේ ලබා දුන් ආයතනය කුමක්ද;

(ii) එම බදු කාල සීමාව ආරම්භවන හා අවසන්වන වර්ෂ කවරේද;

(iii) එම බදු කාල සීමාව සඳහා රජයට ලැබුණු බදු මුදල කොපමණද;

(iv) එම බදු ගිවිසුම සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) එම කම්හල සතු ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) බදු දුන් කාල සීමාවේ දී එකී ඉඩම් අක්කරයක රජයේ තක්සේරු වටිනාකම කොපමණද;

(iii) එහි ඇති යන්ත්‍රවල වටිනාකම කොපමණද;

(iv) එම යන්ත්‍ර බදු ගිවිසුමට අදාළවේද;

(v) නොඑසේ නම්, එකී යන්ත්‍ර කුමක් සඳහා යොදාගනු ලැබුවේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 අගෝස්තු මස 10 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1384/'11

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විදේශ කටයුතු අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි කුළියට හෝ බද්දට ගැනීම සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) එම කුළියට හෝ බද්දට ගත් ගොඩනැගිලිවල එක් වර්ග අඩියක් සඳහා වන මිල කොපමණද;

(iii) එම ගොඩනැගිලි බද්දට ගත් කාල සීමාව කවරේද;

යන්න 2010 සහ 2011 වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයට අදාළ කිසිදු ආයතනයකට අයත් නොවන වාහන කුළියට හෝ බද්දට ගැනීම සඳහා වැය කරන ලද සම්පූර්ණ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) අමාත්‍යාංශයට අයත් වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) පිටතින් ලබා ගන්නා අනෙකුත් සේවාවන් කවරේද;

(iv) ඉහත සඳහන් කරන ලද පිටතින් ලබා ගන්නා සේවා සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(v) පිටතින් සේවය ලබා ගැනීමේ පදනම මත සේවය ලබා ගෙන ඇති පුද්ගලයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(vi) කාර්ය මණ්ඩලයේ සිටින මුළු සාමාජිකයන් සංඛ්‍යාව කවරේද;

යන්නත් විදේශ කටයුතු අමාත්‍යාංශයට අදාළව, ඉහත සඳහන් වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1636/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සුනාමියෙන් විනාශ වූ ගාල්ල මහමෝදර රෝහල යළි ගොඩනැගීම සඳහා රුපියල් මිලියන 3000 ක විදේශ ආධාර මුදලක් ලැබී වර්ෂ පහකට වැඩි කාලයක් ගත වී ඇති බවත්;

(ii) මේ දක්වා එහි ඉදිකිරීම් කටයුතු අත්තිවාරමට පමණක් සීමා වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම රෝහල ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුට රජයේ බදු සහන ලබා දී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රෝහල ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 3000 ක මුදල ලබා දුන් රට කුමක්ද;

(ii) කොන්ත්‍රාත්කරු විසින් එම මුදල් ලබාගෙන රෝහල් ගොඩනැගිල්ල ඉදිනොකිරීම පිළිබඳව සොයා බැලීමට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පරීක්ෂණයක් සිදු කරනු ලැබුවේද;

(iii) එසේ නම්, එහි ප්‍රතිඵලය කවරේද;

(iv) පරීක්ෂණයක් සිදු නොකළේ නම්, ඊට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) නැවතත් විදේශීය ණය මුදලක් ලබා ගෙන මෙහි ඉදිකිරීම් කටයුතු කිරීමේ සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, එම ණය මුදල කොපමණද;

(iii) එම ණය මුදල ලබා ගන්නා ආයතනය සහ රට කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1986/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට රජය සතු පෞද්ගලික සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමාගම්වල නම් සහ ඒවා අදාළ වන අමාත්‍යාංශය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම එක් එක් සමාගම්වල ශ්‍රී ලංකා රජය සතු කොටස්වල ප්‍රතිශතය සහ පෞද්ගලික අංශය විසින් ආයෝජනය කර ඇති කොටස්වල ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) පෞද්ගලික ආයෝජකයින්ගේ නම් සහ ලිපිනයන් එක් එක් සමාගම අනුව කවරේද;

(vi) එම එක් එක් සමාගම 2009 සහ 2010 වර්ෂවලදී ලබා ඇති ශුද්ධ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2382/'12

ගරු අනෝමා ගමගේ මහත්මිය,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරට තිබෙන විදේශ රටවල් නියෝජනය කරන කොන්සියුලර් කාර්යාල සඳහා පුද්ගලයන් නම් කිරීමේදී විදේශ කටයුතු අමාත්‍යාංශය අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ කවරේද;

(ii) එම පත්කිරීමක් අදාළ රට මගින් යෝජනා කළ විට දේශීය බලධාරීන්ට එය අනුමත කිරීම සඳහා ගත වන කාලය කොපමණද;

(iii) එම යෝජිත පුද්ගලයන් සඳහා තිබිය යුතු සුදුසුකම් කවරේද;

(iv) යම් රටක් සිය නියෝජිතයා නම් කිරීමෙන් පසුව එය අනුමත කිරීමට යම් ගැටලුවක් පවතී නම්, ඒ පිළිබඳව අදාළ රටේ රජයට හෝ අදාළ පුද්ගලයාට දැන්වීමක් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1831/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි යෝධ ඇළ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මීට වර්ෂයකට පමණ පෙර මුල්ගල් තැබූ බවත්;

(ii) මෙතෙක් එහි ප්‍රතිසංස්කරණ කටයුතු සමාරම්භක උත්සවයට පමණක් සීමා වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) යෝධ ඇළ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(ii) ප්‍රතිසංස්කරණ කටයුතු මෙතෙක් ආරම්භ නොකිරීමට හේතු කවරේද;

(iii) ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1932/'11

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පොලිස් සේවයේ නියුතු උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව පොලිස් සේවයේ නියුතු සමස්ත පුද්ගලයන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උපාධිධාරී පොලිස් නිලධාරීන්ට උසස්වීම් ලබාදීමට පොලිස් දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරනු ලබන විශේෂිත ක්‍රියා පටිපාටියක් තිබේද;

(ii) උපාධිධාරී පොලිස් නිලධාරීන් උප පොලිස් පරීක්ෂක තනතුරට උසස් කිරීමේදී පොලිස් දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරන විශේෂ තේරීම් පටිපාටියක් තිබේද;

(iii) උපාධිධාරී පොලිස් නිලධාරීන් සඳහා පිළිගැනීමක් ලබාදීමට පොලිස් දෙපාර්තමේන්තුව පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2121/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2011 දක්වා කාල සීමාවේදී මාර්ග සංවර්ධන අධිකාරියට කුලී පදනම මත වාහන ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ලබා ගත් වාහන කවරේද;

(iii) එම වාහන කවර කාර්යයන් සඳහා යොදා ගන්නේද;

(iv) එම කුලී වාහන සැපයූ ආයතනවල නම්, ලිපිනයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(v) ඉහත වාහන ලබාගත් වර්ෂයන් කවරේද;

(vi) මේ වන විට එම වාහන නිදහස් කර තිබේ නම්, එම නිදහස් කළ වර්ෂයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2383/'12

ගරු අනෝමා ගමගේ මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඇණවුම් කරන ලද ඖෂධ ලැබෙනතෙක් ඖෂධ සැපයීම් ඌනතාවන් නැති කිරීම සඳහා දේශීය වෙළඳපලෙන් මිලදී ගත් ඖෂධ සඳහා ගෙවීමට රුපියල් මිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් 2011 වර්ෂය තුළ අනුමතියට ඉදිරිපත් වී තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය සතුව 2011 වර්ෂයේ ඖෂධ අවශ්‍යතාවයන් පිළිබඳව ඇස්තමේන්තුවක් නොතිබුනේද;

(ii) ඇණවුම් ප්‍රමාද වූ නිසා ඉහත වර්ෂය තුළදී දේශීය වෙළඳපලෙන් මිලදී ගැනීමට සිදු වූ ඖෂධ වර්ග කවරේද;

(iii) එම ඖෂධ ඇණවුම් කිරීම් ප්‍රමාද වීමට හේතු කවරේද;

(iv) දේශීය වෙළඳපළෙන් එම ඖෂධ මිලදී ගැනීමේදී අනුගමනය කළ ක්‍රියාමාර්ගය කුමක්ද;

(v) දේශීය වෙළඳපලෙන් මිලදී ගත් ඖෂධ වර්ග, ප්‍රමාණය හා මිලදී ගත් ආයතනය වෙන් වෙන් වශයෙන්;

කවරේද යන්න මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

1832/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල භූමිය තුළ වර්ෂ ගණනාවක් තිස්සේ රුපියල් කෝටි ගණනක් වටිනා රථවාහන රැසක් දිරාපත් වෙමින් පවතින බවත්;

(ii) රාජ්‍ය සම්පත් එලෙස විනාශවීමට ඉඩහැරීම ජාතික අපරාධයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් රථවාහන අලුත්වැඩියා කර නැවත ධාවන කටයුතු සඳහා යොදා නොගැනීමට හේතු කවරේද;

(ii) එම වාහන අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1933/'11

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බාල තත්ත්වයේ පෙට්‍රල් ආනයනය කිරීම හා බෙදාහැරීම හේතුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට දැරීමට සිදු වූ පාඩුව එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහළ සිට පහළ දක්වාම තනතුරුවලින් මෙම වංචාවට අනුබලදී ඇති බවත්;

(ii) වංචාව අනාවරණය කරනු ලැබුවේ විමසිල්ලෙන් පසුවූ වෘත්තිය සමිති සාමාජිකයන් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) 2011 අගෝස්තු 29 වැනි දින භාරදුන් බාල තත්ත්වයේ පෙට්‍රල් ආනයනය කිරීම පිළිබඳ වාර්තාව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) මෙම වංචාකාරී කටයුත්තට සම්බන්ධ වූ නිලධාරීන්ගේ නම් කවරේද;

(ii) ඔවුන්ට එරෙහිව ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද;

(iii) මෙම වංචාවට සම්බන්ධවූ නිලධාරීන්ට දැඩි ඕනෑකමකින් දඬුවම් ලබා දීමටත්, හෙජිං වංචාවට වරදකරුවන් වූ උසස් තනතුරු දරන නිලධාරීන්ට නිදහසේ කටයුතු කිරීමට ඉඩදීමටත් හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2122/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමත සේවක මණ්ඩලයට අයත් රියදුරන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2005 සිට 2011 දක්වා කාල සීමාව තුළ බඳවා ගත් රියදුරන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් අතරින් වෙනත් රාජ්‍ය ආයතන වෙත නිදහස් කර ඇති රියදුරන් සංඛ්‍යාව කොපමණද;

(iv) එසේ නිදහස් කළ රියදුරන්ගේ නම් සහ ඔවුන් නිදහස් කළ රාජ්‍ය ආයතන කවරේද;

(v) එම රියදුරන් සඳහා ගෙවන ලද වැටුප් අදාළ ආයතනයන්ගෙන් ප්‍රතිපූරණය කරගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 9/'10

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කිරීම,— දිවයින තුළ ජාතික මමත්වයක් වර්ධනය කිරීමට හැකිවනු වස් පාර්ලිමේන්තුවේ රැස්වීම ආරම්භ කිරීමට හා අවසාන කිරීමට පෙරාතුව පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/'10

ගරු රවී කරුණානායක මහතා,— බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීම,— ආණ්ඩුවේ ලිපිලේඛනාදියෙහි යම් කෙනෙකුගේ ජාතිය හා ආගම සඳහන් කිරීම අවශ්‍ය කරුණක් වීම බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීමට බාධාවක් හා අවහිරයක් වී ඇති බැවින් එම අවශ්‍යතාවය ඉවත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/'10

ගරු රවී කරුණානායක මහතා,— වාණිජ අරමුණු සඳහා ආගමික නායකයින්ගේ රූප භාවිතා කිරීම වැළැක්වීම,— සියලුම ආගම්වලට සමානව ගරු කළ යුතු අතර කිසිදු වෙළෙඳ දැන්වීමක හෝ වෙනත් ආගමික නොවන භාණ්ඩයක බුදුරජාණන් වහන්සේගේ, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ, ශිව දෙවියන්ගේ සහ මහම්මත් නබිතුමන්ගේ රූප ඇතුලත් නොකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/'10

ගරු රවී කරුණානායක මහතා,— අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කිරීම,— සියලු දෙනාටම සමාන සාධාරණත්වයක් සහතික කරනු වස් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් සහ උද්දීප්තිමත් නිදහස් මාධ්‍යයක් පවත්වාගෙන යාම සඳහා අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/'10

ගරු රවී කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්ති වල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම් වලට යොමු කැරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'10

ගරු රවී කරුණානායක මහතා,— දේශපාලන පක්ෂ විසින් මැතිවරණ කොමිෂන් සභාවට මූල්‍ය විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම,— සියලුම පිළිගත් දේශපාලන පක්ෂ විසින් උපයාගත් ආදායම් හා දැරූ වියදම් විගණනයට භාජනය කළ යුතු හා මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් පැමිණවීම,— රජයේ උසස් නිලධරයන් තම ස්වාධීන නිලය දේශපාලනීකරණය කරන්නේ නම් හා අයථා ලෙස යොදා

ගන්නේ නම්, එයින් වැරදිකරුවන් බව ඔප්පු වූ වහාම ඔවුන්ට දඬුවම් පැමිණවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'10

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව දීර්ඝ කිරීම,— රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කළ යුතු යැයිද, ව්‍යවස්ථාදායකය විසින් නිර්දේශ කරනු ලැබුවහොත් විශේෂ කුසලතා ඇති නිලධාරීන් සඳහා එය අවුරුදු 70 දක්වා දීර්ඝ කළ හැකි යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/'10

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ සභාවක් ස්ථාපිත කිරීම,— වගකීමකින් තොරව විශ්වවිද්‍යාල නාමයන් භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් අධ්‍යාපනික ආයතන බිහිවෙමින් පවතින නිසා, අධ්‍යාපනය අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා කර දීම උදෙසා "තත්ත්ව ආරක්ෂණ සභාවක්" නීතිමය වශයෙන් වහා ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'10

ගරු රවී කරුණානායක මහතා,— "විශේෂ නඩු පවරන නිලධාරී" නමැති තනතුරක් ඇති කිරීම,— රාජ්‍ය සේවය දේශපාලන බලපෑම් වලින් තොර බවට සහතික කරනු වස්, ආයතනවල ගුණාත්මකභාවයට බලපාන ලෙස සිදු කළ අයථා පරිහරණයන්, දූෂණයන් හෝ අකාර්යක්ෂමතාවයන් පිළිබඳ සිද්ධීන්, ස්වාධීන කොමිසම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් වාර්තා කළ වහාම ඒ සම්බන්ධ පැමිණිලි මෙහෙයවන, පාර්ලිමේන්තුවට සෘජුවම වාර්තා කරනු ලබන තනතුරක්, "විශේෂ නඩු පවරන නිලධාරී" නමින් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'10

ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'10

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'10

ගරු රවී කරුණානායක මහතා,— අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— සාමය කඩවීම වැනි ජාතික ප්‍රශ්නයක් ඇති ශ්‍රී ලංකාව බහු ජාතික හා බහු ආගමික රටක් වන හෙයින්, ශ්‍රී ලංකාව තුළ, කලාපය තුළ හා සමස්ත වශයෙන් ලෝකයේම එවැනි ප්‍රශ්න විසඳීම සඳහා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හා ඉස්ලාම් ආගම්වල ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටු විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'10

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීම,— මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'10

ගරු රවී කරුණානායක මහතා,— ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත්කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ලිංගික අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'10

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් සහ විවිධ දක්ෂතා ඇති පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර ගැනීම සඳහා ද ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'10

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොල සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'10

ගරු රවී කරුණානායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රී ලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'10

ගරු රවී කරුණානායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'10

ගරු රවී කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දීම,— සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දිය හැකි වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'10

ගරු රවී කරුණානායක මහතා,— පාසල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'10

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා පාසල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩ පිළිවෙළක් සකස් කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසල් ඉදි කිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'10

ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/'10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීම සඳහා නීති සම්පාදනය කිරීම,— රජයේ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා ද, මහජනතාවට සියලු රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීමේ අයිතිය උදෙසා ද පාර්ලිමේන්තුව තුළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/'10

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයින්ට වඩා යහපත් සෞඛ්‍ය අවස්ථාවන් සලසා දීම,— ජනතාවගෙන් විශාල පිරිසකට හදවත් සැත්කම් කිරීම අවශ්‍යව ඇති හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට වඩා හොඳ සෞඛ්‍ය අවස්ථාවන් සලසා දිය යුතු යැයි ද, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදල හෝ සේවක භාරකාර අරමුදල හරහා නොමිලයේ පහසුකම් සලසා දිය යුතුයැයි ද, රජයේ සේවකයන් හෝ සේවා වියුක්තිකයන් සඳහා සම්පූර්ණ වියදම රජය විසින් ජනාධිපති අරමුදල හරහා සැපයිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/'10

ගරු රවී කරුණානායක මහතා,— ලෝක පරිසරය ආරක්ෂා කිරීම,— ශ්‍රී ලංකාව, ලෝක පරිසරය ආරක්ෂා කිරීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතු අතරම ගෝලීය උණුසුම වැළැක්වීමට විශේෂයෙන් පියවර ගතයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/'10

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු විකාශනය කිරීම,— රූපවාහිනිය හෝ අන්තර්ජාලය හරහා පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු සජීවීව හෝ පරීක්ෂිතව විකාශනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/'10

ගරු රවී කරුණානායක මහතා,— එතෙර ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දීම,— එතෙර ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ට ඉදිරි මැතිවරණ සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/'10

ගරු රවී කරුණානායක මහතා,— විද්‍යුත් ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම,— යල්පැන ගිය වර්තමාන ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමය වෙනුවට විද්‍යුත් ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.51/'10

ගරු අජිත් කුමාර මහතා,— ගාලු කොටුව හා ඒ ආශ්‍රිත ඓතිහාසික හා පුරා විද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම හා නිසි ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කිරීම,— සංචාරක කර්මාන්තයේ ඉතා වැදගත් මධ්‍යස්ථානයක් වූ ද, ඓතිහාසික හා පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුතු වූ ද, ලෝක උරුමයක් ලෙස සැලකෙන ගාලු කොටුපවුර, ගාලු කොටුව ඇතුළත හා ගාලු කොටුව ආශ්‍රිතව ඇති ඓතිහාසික හා පුරා විද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත්, ඒ හා සම්බන්ධ රාජ්‍ය ආයතන හා ජන සහභාගීත්වය ඇතිව විධිමත් සැලැස්මක් ක්‍රියාත්මක කරමින් අප රටට මෙම ඓතිහාසික උරුමයේ නිසි ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/'10

ගරු රවී කරුණානායක මහතා,— ඡන්ද හිමි නාම ලේඛනය නිරතුරුව යාවත්කාලීන කිරීම,— ඡන්ද හිමි නාම ලේඛනය මුළු වර්ෂයෙන්ම දින තිහක කාලයක් සඳහා පමණක් යාවත්කාලීන වන ලයිස්තුවක් නොව නිරතුරුවම යාවත් කාලීන වන විවෘත ලැයිස්තුවක් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/'10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියාවල නියුතු අය සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබාදීම, —විදේශ ගතවී ඉතා අපහසුවෙන් උපයාගත් ධනය ශ්‍රී ලංකාවේ ධන සම්පත්තිය වැඩිකිරීම සඳහා එවන විදේශ රැකියාවල නියුතු අය ඇගයීම පිණිස විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා දීම සඳහා පියවර ගතයුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/'10

ගරු රවී කරුණානායක මහතා,— 2009 මැයි 19 දිනට පෙර සේවයේ සිටි සන්නද්ධ සේනාවන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම,—පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වසර පහක සේවා කාලය සම්පූර්ණවූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලබන බැවින් සන්නද්ධ සේනාවන්වල අවුරුදු 22 ක කාලය සම්පූර්ණ නොකළද 2009 වර්ෂයේ මැයි 19 වන දිනට පෙර ක්‍රියාකාරී සේවයේ යෙදී සිටි යුධ සෙබළුන්ට ද විශ්‍රාම වැටුප් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/'10

ගරු රවී කරුණානායක මහතා,— දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන් සඳහා විශේෂ සැලසුම් හඳුන්වාදීම,— නීතියේ සඳහන් වන පරිදි දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන්ගේ පහසුව තහවුරු කිරීමට හා ඔවුන් සතු ඵලදායීතාව වර්ධනය කිරීම සඳහාත් ඔවුන් අනවශ්‍ය ලෙස අනුන් මත යැපීම අවම කිරීම සඳහාත් සියලු නව රජයේ ගොඩනැගිලිවල විශේෂිත සැලසුම් ක්‍රමයක් ඇතිකළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/'10

ගරු රවී කරුණානායක මහතා,— ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කිරීම,— ලියාපදිංචිවූවද ඡන්දය ප්‍රකාශකිරීමට අවස්ථාව නොලැබුනු ඡන්දදායකයන් බොහෝ සංඛ්‍යාවක් සිටින බැවින් වයස අවුරුදු 18 ට වැඩි සියලුම පුද්ගලයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දිය යුතු බව සහ ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන්වූ නමුත් ඡන්දය ප්‍රකාශ නොකරන පුද්ගලයන්ගෙන් දඩ මුදලක් අයකළ යුතුබව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/'10

ගරු රවී කරුණානායක මහතා,— දූෂණයෙන් තොර ලෝකයක් තහවුරු කිරීම— දූෂණය මුලින් උපුටා දැමීම සඳහා ලෝකයේ පාර්ලිමේන්තු සංවිධාන සමඟ එක්වී ශ්‍රී ලාංකික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කටයුතු කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 69/'10

ගරු රවී කරුණානායක මහතා,— මුළාවට ලක්වූ තැන්පත්කරුවන්ට තම මුදල් නැවත ගෙවීම,— ව්‍යාජ මූල්‍ය ආයතනවල තම මුදල් තැන්පත්කර එමඟින් මුළාවට ලක්වූ බොහෝ දෙනෙක් සිටින බැවින් හා පසුගිය 2009/2010 මැතිවරණ ව්‍යාපාරයේදී මෙම රජය විසින් තැන්පත්කරුවන් සහ මූල්‍ය ආයතනවලට ඔවුන්ගේ හිඟ මුදල් නැවත ගෙවීමට පොරොන්දුවී ඇති බැවින්, මහ බැංකුව මෙම ආයතනවල භාරකරු හෙයින් වඩා කාර්යක්ෂම ලෙස කටයුතු කළ යුතු බවත්, තැන්පත්කරුවන්ට තම හිඟ මුදල ලබා දීමට රජය ඉදිරිපත් විය යුතු බවත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 72/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සාමවිනිසුරු තනතුරු ලබා දීමේ දී විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම,— මුළු මහත් සමාජයම පොදුවේ පිළිගනු ලබන සහ සමාජයට විශාල සේවාවක් සපයනු ලබන තනතුරක් වන සාමවිනිසුරු තනතුරු ලබා දීමේදී ඒ සඳහා සුදුසු නිර්නායක පදනම් කොට ගෙන එම තනතුරු ලබා නොදීම නිසා එම තනතුරෙහි ගෞරවය හා පොදු පිළිගැනීම ක්‍රමයෙන් හීන වන බැවින් ඒ සඳහා පොදුවේ පිලිගත හැකි නිර්නායක පදනම් කර ගන්නා වූ ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.74/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සුනාමි ඛේදවාචකයෙන් ඇතිවූ ගැටලු විසඳීම,— සුනාමි ඛේදවාචකය හේතුවෙන් කුමන හෝ ආකාරයේ ගැටලුවකට මුහුණ දී මේ වන තෙක් නොවිසඳී පවතින ගැටලු තිබේ නම්, ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස මට්ටමින් සොයා බලා ඔවුන් මුහුණ දී ඇති හා දැනටත් මුහුණ දෙනු ලබන ගැටලු අවම කිරීම සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.75/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ විවිධ රැකියා උත්පාදන ක්ෂේත්‍ර තුළ විවිධ නිෂ්පාදන කටයුතු කරන දසලක්ෂයකට ආසන්න ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා දේශපාලන බල අධිකාරිය ඒ සඳහා සබැඳි සියලු ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයින්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි ද සහාය ලබා ගනිමින් විධිමත් ජාතික ප්‍රතිපත්තියක් සකස් කොට එය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.76/’10

ගරු බුද්ධික පතිරණ මහතා,—වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම් ඵලදායි කටයුතු සඳහා යොදා ගැනීම,—කුඹුරු ඉඩම් ගොඩකිරීමේ නීතිය උල්ලංඝනය නොවන පරිදි, විධිමත් අධ්‍යයනයකින් හඳුනා ගැනීමෙන් පසු කිසිසේත්ම වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම්වල ඵලදායී කෘෂි නිෂ්පාදන පමණක් වගා කිරීමටත් ,ඉදිකිරීම් කටයුතු සඳහා කිසිසේත්ම ඉඩ ප්‍රස්ථා නොලැබෙන ආකාරයේ වැඩසටහන් සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.77/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය සේවයේ විශ්‍රාමකයින්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— 2006/6 වැටුප් ප්‍රතිශෝධන චක්‍ර ලේඛයට අනුව 2006.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් පරිවර්තනය කිරීම නිසා 2006.06.01 දිනට පෙර විශ්‍රාම ගිය සහ ඉන්පසු විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන් අතර දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින් එය ඉවත් කිරීමට ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.78/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීම,— භූගෝලීය පිහිටීම, ඓතිහාසික පසුබිම, වගාකරන භෝග වර්ග, මාර්ග පද්ධතිය, රජයේ කාර්යාල, පාසල්, විශ්වවිද්‍යාල, දුම්රිය ස්ථාන සහ බස් නැවතුම් පොළවල් ආදි සියලුම තොරතුරු පරිගණක ගත කරන ලද හා ලේඛන ගත කරන ලද තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීමටත්, එහි පළමු පියවරේදී පළාත් මට්ටමින්, දෙවැනි පියවර ලෙස දිස්ත්‍රික් මට්ටමින් සහ තෙවැනි පියවර ලෙස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ මට්ටමින් මෙම මධ්‍යස්ථාන ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.79/’10

ගරු බුද්ධික පතිරණ මහතා,—ශ්‍රී ලංකාවේ දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය විධිමත් කිරීම,— ශ්‍රී ලංකාවේ සියලුම ආගම්වල දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය වඩාත් විධිමත් කිරීමට සහ බෞද්ධ දහම් පාසල් තුළ පවත්නා දහම් අවසාන හා ධර්මාචාර්ය විභාග මෙන්ම සියලුම ආගම්වල දහම් පාසල් තුළ පැවැත්වෙන ඒ හා සමාන විභාග සහතික පත්‍ර සඳහා නිසි පිළිගැනීමක් ලබා දීමට, දහම් පාසල් සඳහා අඛණ්ඩව මානව සම්පත් හා භෞතික සම්පත් ලබා දීමෙන් දහම් පාසල් සඳහා පැමිණෙන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.80/’10

ගරු බුද්ධික පතිරණ මහතා,—සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් ඇති කිරීම සම්බන්ධ නීති සම්පාදනය,— නිවෙස්වල හෝ අලෙවි කිරීම සඳහා ඇති කරන සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් පළාත් පාලන ආයතනවල ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු අතර, එම සතුන්ගේ පැටවුන් අලෙවි කිරීම නීත්‍යානුකූලව අවසර ලත් මධ්‍යස්ථානවලදී පමණක් සිදු කළ යුතු බවත්, එසේ නොවන ස්ථානවල ඇති කරන ගැහැණු සතුන් අනිවාර්යයෙන්ම වන්ද්‍යාකරණයට ලක් කිරීමටත්, අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 81/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රැකියා වෙළඳපොළට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම—, අනාගත ශ්‍රී ලංකාවේ බිහිවන නව රැකියා අවස්ථා සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීමේ ක්‍රමවේදයකට මුල පිරීමේ කාර්යය වඩාත් කාර්යක්ෂම ලෙස රට තුළ පවත්නා සියලුම තෘතීක අධ්‍යාපන ආයතන මගින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 82/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම,— දැනට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ග්‍රාම නිලධාරි වසම් යළි සීමා නිර්ණය කිරීම සඳහා කටයුතු කරගෙන යමින් සිටින බැවින් එසේ සීමා නිර්ණය කරනු ලබන ග්‍රාම නිලධාරී වසම් තුළින් නව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ සීමා සහ නව දිස්ත්‍රික් සීමා නිර්ණය කළ යුතු බවත්, මෙසේ නිර්ණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය පළාත් පාලන ආයතන බල ප්‍රදේශය බවට පත්කළ යුතු අතර එකී බල ප්‍රදේශයට කොට්ඨාස අධ්‍යාපන බල ප්‍රදේශය, පොලිස් බල ප්‍රදේශය, ගොවිජන සේවා බල ප්‍රදේශය, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරී බල ප්‍රදේශය ඇතුළු සියලු රාජ්‍ය ආයතනයන්හි බල ප්‍රදේශ සීමා සංයුක්ත වන පරිදි සමස්ත රාජ්‍ය ව්‍යුහයම ප්‍රතිසංවිධානය විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු යළි ආරම්භ කිරීම,— මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු අතර මග ඇන හිටීමෙන් එම මිටියාවතේ පෝෂක ප්‍රදේශයන්හි භව භෝග වගා කරන ජනතාවට මුහුණ පෑමට සිදුවී ඇති ගැටලු කඩිනමින් විසඳීමට පියවර ගත යුතු බවත්, නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු කඩිනමින් යළි ආරම්භ කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 84/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයිනගේ නිල කාලයට පසුද සාමවිනිසුරු පදවිය ලබාදීම,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ට දෙනු ලබන සාමවිනිසුරු තනතුරු ඔවුන්ගේ නිල කාලයට පමණක් සීමාවන බැවින්, නිල කාලයෙන් පසුවත් ඔවුන්ගෙන් එම සේවාව ලබා ගැනීම සඳහා පැමිණෙන විශාල පිරිසක් අපහසුතාවයට පත්වන බැවින්, එම මහජන නියෝජිතයන්ට තම නිල කාලයෙන් පසුවත්, සාම විනිසුරු තනතුරු ලබා දීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 85/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම පළාත් සභා ජනතා නියෝජිතයන්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳව නැවත සලකා බැලීම,— දිවයිනේ දැනට ක්‍රියාත්මක වන පළාත් සභා හා ඉදිරියේදී විධිමත්ව ක්‍රියාත්මකවීමට නියමිත උතුරු පළාත් සභාවේ ගරු අමාත්‍යවරුන්, සභාපතිවරුන්, උපසභාපතිවරුන්, ආණ්ඩු පාර්ශ්වයේ සංවිධායකවරුන්, සභා නායකවරුන්, විරුද්ධ පාර්ශ්වයේ නායකවරුන්, විරුද්ධ පාර්ශවයේ ප්‍රධාන සංවිධායකවරුන් සහ ගරු මන්ත්‍රීවරුන්ගේ දීමනා, වරප්‍රසාද හා පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 86/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන ආයතන වල සියලුම මහජන නියෝජිතයින්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳ නැවත සලකා බැලීම,—දිවයිනේ ක්‍රියාත්මක වන හා ඉදිරියේදී ක්‍රියාත්මකවීමට නියමිත සියලුම මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවන්හි පුරපතිවරයන්, නගරාධිපතිවරයන්, සභාපතිවරයන්, නියෝජ්‍ය පුරපතිවරයන්, නියෝජ්‍ය නගරාධිපතිවරයන්, උප සභාපතිවරුන්, විපක්ෂනායකවරයන් හා මන්ත්‍රීවරයන්ගේ දීමනා, වරප්‍රසාද සහ අනෙකුත් පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.87/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— උතුරු නැගෙනහිර අතුරුදහන් වූ දෙමළ ජනතාවට මරණ සහතික ලබා දීම,— උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධය පැවති පසුගිය දශක තුනක පමණ කාලය තුළ විවිධ හේතූන් නිසා අතුරුදහන් වී ඇති පුද්ගලයන් මේ වන විට ජීවතුන් අතර සිටී ද නැද්ද යන්න කඩිනමින් පරීක්ෂණ පවත්වා ඔවුන් ජීවතුන් අතර නොමැති නම් ඔවුන් සඳහා මරණ සහතික ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 88/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම,— සියලුම දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත්කොට ශ්‍රී ලංකාවට යෝග්‍යවූ ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළ යුතුයැයි ද, ඒ සඳහා ඒ හා සබැඳි සියලු ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි ප්‍රවීණයන්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහාය ලබා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 89/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,—රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මුල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩ පිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 90/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරීන් පත් කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 91/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සභා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දුරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 92/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඩුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 93/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ 1988 සිට 2010 දක්වා වසර 22 ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදී සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 94/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 95/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩ සටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩ සටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 96/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 98/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 99/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම,— පරිපාලනය පහසු කිරීම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවමකිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළයුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 100/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම, — පොලිස් දෙපාර්තුමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 101/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම ,—රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 102/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන්/ නිලධාරිනියන් සේවයේ ස්ථිර කිරීම, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන් හා නිලධාරිනියන් සඳහා ද රජයේ අනෙකුත් ආරක්ෂක අංශවල සේවයේ නියුතු නිලධාරීන් හා නිලධාරිනියන්ට මෙන් වැටුප්, දීමනා, ස්ථිර සේවය සහ විශ්‍රාම වැටුප් සහිත රජයේ වෙනත් දෙපාර්තුමේන්තුවල මෙන් පිළිගත් නිල තත්ත්වයක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 103/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—සහතික වීම පිලිබඳ කාරක සභා ඇති කිරීම,— පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිලිබඳ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 104/'10

ගරු. (අල්හාජ්) ඒ.එච්.එම්. අස්වර් මහතා,— තල් ගස් වගාව දිරිමත් කිරීම,— "කටිපගතරු" යන නමින් හැඳින්වෙන පොදු ජනතාවට ඉමහත් ප්‍රයෝජනවත් වන තල් ගස් වගාව දිරිමත් කිරීමෙන් තල් ආශ්‍රිත නිෂ්පදන ප්‍රවර්ධනයට සියලු පියවර ගත යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 105/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සමබන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා සෘජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.109/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මගින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.110/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.111/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.112/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මහ හරවා ඔවුන්ගේ ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.113/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.114/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැලපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.115/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමූපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.116/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට(20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.117/'10

ගරු රුවන් රණතුංග මහතා,— අතුරු බෙදීම් තහනම් නිකුත්කර ඇති රජයේ දීමනා පත්‍ර ඉඩම්වල අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීම,— ජය භූමි, ස්වර්ණ භූමි, රත්න භූමි ආදී රජයේ ඉඩම් දීමනා පත්‍රලාභීන්ගේ ඉඩම්වල අතුරු බෙදීම් තහනම් වුවත්, මුල් ඉඩම්ලාභීන්ගේ දෙවන පරම්පරාවේ අයිතිය තහවුරු කිරීමටත්, ඔවුන්ගේ ගේ දොර වතුපිටිවල සංවර්ධන කටයුතු කිරීමටත් අතුරු බෙදීම් අවශ්‍යතා පැන නැගුණු විට, පළාත් කොමසාරිස්, ඉඩම් කොමසාරිස් සහ ජනාධිපති ලේකම් කාර්යාලය හරහා දැනට ක්‍රියාත්මක වන දීර්ඝ ක්‍රියාවලිය අවම කොට අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීමට අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.118/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.119/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතුරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.120/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.122/'11

ගරු රුවන් රණතුංග මහතා,— රාජ්‍ය බැංකුවල පොලී ගෙවීම සහ පොලී අයකිරීම අතර පවතින පරතරය අඩු කිරීම,— රාජ්‍ය බැංකුවල සාමාන්‍ය ඉතුරුම් තැන්පතු සඳහා ගෙවන පොලී අනුපාතය 4 % සිට 4.5 % දක්වාද ස්ථාවර තැන්පතු සඳහා ගෙවන පොලී අනුපාතය 8 % පමණ ද වන අතර බැංකු විසින් නිවාස, ව්‍යාපාරික සහ කෘෂිකාර්මික වැනි ණය සඳහා අය කරනු ලබන පොලී අනුපාතය 12 % සිට 13 % ක් ද පමණ වන බැවින් ජනතාවට සහ කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ට අතදීම සඳහාත් ඔවුන් දිරිගැන්වීම සඳහාත් මෙම අයකරන පොලිය සහ ගෙවන පොලිය අතර පවතින පරතරය අඩුකිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.123/'11

ගරු රුවන් රණතුංග මහතා,— උපාධිධාරී ග්‍රාම නිලධාරීන් අගැයීම සඳහා දීමනාවක් ලබා දීම,— රාජ්‍ය සේවය ගම් මට්ටමින් ජනතාවට ලබා දීම සඳහා සේවය කරන ග්‍රාම නිලධාරීන් අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් පසුව තරඟ විභාග ලකුණු මත බඳවා ගෙන ඇතත්, දැනට සේවයේ යෙදී සිටින ග්‍රාම නිලධාරීන් අතුරින් 30 % ක් 40 % ක් පමණ පිරිසක් උපාධි සුදුසුකම් ලබා ඇති අතර එයට කිසිදු සැලකිල්ලක් මෙතෙක් දක්වා නැති බැවින් උපාධි සුදුසුකම අගැයීම සඳහා උපාධිධාරී ග්‍රාම නිලධාරීන්ට වැටුප් වැඩිවීමක් හෝ දීමනාවක් ලබා දීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.124/'11

ගරු රුවන් රණතුංග මහතා,— ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත් සහ වාර සඟරාවල බුද්ධ රූපය පළ කිරීම තහනම් කිරීම,— දෛනික පුවත්පත්වල සහ වාර සඟරාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප කිසිදු පාලනයකින් තොරව අසීමිතව මුද්‍රණය කෙරෙන අතර එම

පත්‍රිකා විවිධ භාණ්ඩ දවටන සහ වෙනත් අයෝග්‍ය කටයුතු සඳහා භාවිතා කිරීම බුදුරජාණන්වහන්සේට අගෞරවයක් වන බැවින් 2600 වැනි සම්බුද්ධ ජයන්තිය සැමරීම ද සැලකිල්ලට ගෙන මින් ඉදිරියට ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත්, වාර සඟරා සහ වෙනත් පත්‍රිකාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප පළ කිරීම තහනම් කිරීම සඳහා අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.126/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ත්‍රිභාෂා ශ්‍රී ලංකාවක් සඳහා "සහෝදර පාසල් වැඩසටහනක්" ස්ථාපනය කිරීම,— ත්‍රිභාෂා ශ්‍රී ලංකාවක් සඳහා වන දස අවුරුදු ජාතික සැලැස්මක් ඇති කිරීම ජාතික ඒකාබද්ධතාව සහ සමාජ සංහිඳියාව සඳහා ඉතා වැදගත් ක්‍රියා මාර්ගයක් බැවින්, කෙටි කාලීන නිරාවරණ වැඩ සටහන් යටතේ ශිෂ්‍යයන් සහ ගුරුවරුන් හුවමාරුව සඳහා "සහෝදර පාසල් වැඩසටහනක්" මගින් බහුතරයක් සිංහල භාෂාව කථා කරන ප්‍රදේශවල තිබෙන එක් එක් පාසල්, දෙමළ මාධ්‍ය පාසල් සමග සම්බන්ධ කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.127/'11

ගරු රවී කරුණානායක මහතා,— ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය නැවත නම් කිරීම,— නිදහස් අධ්‍යාපනයේ පියා වන දිවංගත ගරු (ආචාර්ය) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතාට ගෞරවයක් වශයෙන් ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය එතුමාගේ නමින් නැවත නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.128/'11

ගරු අජිත් කුමාර මහතා,— පූර්ව ළමා විය අධ්‍යාපනය පිළිබඳව ජාතික වැඩපිළිවෙළක් සකස් කිරීම,— අප රට තුළ දරුවන්ගේ අධ්‍යාපනයේ ඉතා වැදගත් අවස්ථාවක් වන පූර්ව ළමා විය අධ්‍යාපනය ලබා දීම (පෙර පාසල් අධ්‍යාපනය) පිළිබඳව ජාතික වැඩපිළිවෙළක් සකස් කළ යුතු අතර පෙර පාසල් පාලිකාවන්ට විධිමත් පුහුණුවක් හා බඳවා ගැනීමේ ක්‍රමයක් සමගින් වැටුප් ක්‍රමයක් ද සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.129/'11

ගරු අජිත් කුමාර මහතා,— ගාල්ල දිස්ත්‍රික්කයේ ඓතිහාසික ස්ථාන පිළිබඳ නිබන්ධනයක් සකස් කිරීම,— ගාල්ල දිස්ත්‍රික්කයේ ඓතිහාසික, පුරා විද්‍යාත්මක හා සංස්කෘතිකමය වශයෙන් වටිනා ස්ථාන සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදුකර ඒ පිළිබඳව ශාස්ත්‍රීය වශයෙන් වටිනාකමක් ඇති නිබන්ධනයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.130/'11

ගරු රවී කරුණානායක මහතා,— මැතිවරණ ක්‍රියාවලිය සහ මැතිවරණ පැවැත්වීම පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම,— මැතිවරණ ක්‍රියා පටිපාටිය සහ මැතිවරණ පැවැත්වීම පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් ස්ථිර පදනමකින් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.131/'11

ගරු රවී කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදලින් සහ සේවක භාරකාර අරමුදලින් කඩිනමින් මුදල් ගෙවීම,— සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වය දරන සියලුම සාමාජිකයින්ට ගෙවිය යුතු මුදල් ක්‍රියාකාරී සේවයෙන් විශ්‍රාම ගෙන එක් මසක් ගතවීමෙන් අනතුරුව ගෙවීම සඳහා විධිවිධාන සැළසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.132/'11

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය මාධ්‍යවල අපක්ෂපාතීත්වය තහවුරු කිරීම,— රාජ්‍ය මාධ්‍ය ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට පමණක්ම හිමි වූ තනි අයිතිවාසිකමක්වන නිසාත්, රජයේ මාධ්‍ය නිරන්තරවම දේශපාලනීකරණයට ලක්වීමක් සිදුවී තිබෙන නිසාත් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී සිටින සියලුම දේශපාලන පක්ෂවලට රාජ්‍ය මාධ්‍ය තුළින් සමාන ලෙස සැලකීම සහ සමාන ලෙස අවස්ථාවන් ලබාදීම තහවුරු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.133/'11

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය සේවයේ භාෂා ප්‍රවීණත්වයේ අවශ්‍යතාව,— වර්ෂ 2025 වන විට සියලුම රජයේ සේවකයන්ට සිංහළ, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම වැඩ කටයුතු කිරීමට, ලිපි හුවමාරු කර ගැනීමට සහ කථා කිරීමට හැකි වීම රජය විසින් අනිවාර්ය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.134/'11

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත අයවැයෙන් ප්‍රතිපාදන වෙන්කරදීම,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනා වෙත, දළ ජාතික නිෂ්පාදිතයෙන් 1% කට සමාන වූ විමධ්‍යගත අයවැය මුදලක් වාර්ෂිකව වෙන්කළ යුතු බවත් එම වෙන්කිරීමෙන්, 50% ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් උපයෝගීකර ගැනීමටත් ශේෂය රජයේ නිර්ණායක මත පදනම්ව තම ඡන්ද දායකයින් වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ අභිමතය පරිදි කවර හෝ පදනමකින් උපයෝගී කර ගැනීම සඳහාත් හිමිකම් ලබා දිය යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.138/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන පාඨමාලාවන් රැකියාභිමුඛ පාඨමාලාවන් බවට පත්කිරීම,— දිවයිනේ සියලුම රජයේ විශ්වවිද්‍යාල සහ පෞද්ගලික විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන ශාස්ත්‍රීය අධ්‍යාපනයම සඳහා වූ උපාධි පාඨමාලාවන් රැකියාභිමුඛ වෘත්තීයමය උපාධි පාඨමාලාවන් බවට පරිවර්තනය කර එමගින් බිහිවන්නා වූ උපාධිධාරීන් වෙත නව රැකියා සපයා දීමේ අරමුණ ඇතිව, සියලුම විශ්වවිද්‍යාල සමඟ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන සම්බන්ධීකරණය සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.139/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් ප්‍රවාහනය කරනු ලබන වෑන් රථ සඳහා නිසි ප්‍රමිතීන් නියම කිරීම,— දිවයින පුරා පවත්වාගෙන යනු ලබන පාසල් සිසු ප්‍රවාහන සේවාවන් නියමිත ප්‍රමිතියෙන් නොපවතින බැවින් සහ ඇතැම් පාසල් වෑන් රථ සේවකයින්ගේ පැවතුම් යහපත් තත්ත්වයෙන් නොපවතින බැවින්, නිසි ප්‍රමිතියෙන් යුතු වෑන් රථ සේවාවක් පවත්වාගෙන යෑම සඳහාත්, එම සේවාවන් ලබාගන්නා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, වෑන් රථ සේවාවන් සඳහා ප්‍රමිතීන් හඳුන්වාදිය යුතුයැයි ද, වෑන් රථ සේවකයින් තුළ යහපත් පැවතුම් පවත්වාගෙන යාම සඳහා විනය නීති මාලාවක් හඳුන්වා දිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.140/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පොල් කර්මාන්තයෙහි සහ පොල් සම්පත්වල සංවර්ධනය හා ප්‍රවර්ධනය විධිමත් කිරීම,— වාණිජමය නිෂ්පාදන අතර ඉතා වැදගත් ස්ථානයක් පොල්වලට හිමි වන හෙයින් පොල් සම්පත් සහ ඒවායේ පරිසරය තිරසාරව පවත්වා ගන්නා අතරම දළ දේශීය නිෂ්පාදිතයට සුවිශේෂී දායකත්වයක් ලබා දෙන ලෙස පොල් කර්මාන්තය සහ පොල් සම්පත්වල සංවර්ධනය විධිමත් කොට ප්‍රවර්ධනය කිරීම උදෙසා අර්ථාන්විත පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.141/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කිතුල් කර්මාන්තය නගා සිටුවීම උදෙසා කිතුල් වගා කිරීම වැඩි කිරීම,— ග්‍රාමීය කර්මාන්ත කෙරෙහි කිතුල් මගින් සිදු කරනා සුවිශාල දායකත්වය හේතු කොට ගෙන ග්‍රාමීය කර්මාන්ත සහ ග්‍රාමීය ප්‍රජාව නගා සිටුවීම පිණිස වගාවන් තුළ කිතුල් ගහනය වැඩි කිරීම සඳහා වන අපගේ දිරිය සැලසුමට අනුගතව නව කිතුල් වගාවන් සංඛ්‍යාව වැඩි කිරීම උදෙසා නිසි ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.142/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ශ්‍රී ලංකාව වටා දූෂණයෙන් තොර සමුද්‍රික පරිසරයක් සුරක්ෂිත කිරීම,— තිරසාර ජාතික සංවර්ධනයක් සහ ස්වකීය ජනතාවගේ සහ ආර්ථිකයේ යහ පැවැත්ම උදෙසා, වසර 2020 වන විට ශ්‍රී ලංකාව වටා දූෂණයෙන් තොර සමුද්‍රික පරිසරයක් තහවුරු කිරීම පිණිස පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.143/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කජු වගාව වැඩි දියුණු කිරීම උදෙසා කටයුතු ආරම්භ කිරීම— කජු සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සැකැසුම, අලෙවි කිරීම සහ වගා කිරීමට ආධාර කිරීම සහ එමගින් ප්‍රධාන පෙළේ, තත්වයෙන් උසස් සහ වටිනාකම එකතු කළ කජු නිෂ්පාදකයකු සහ අපනයනකරුවකු බවට පත්වීම සඳහා ශ්‍රී ලංකාවට සහාය ලබා දීම පිණිස කජු වගාව වැඩි දියුණු කිරීම උදෙසා කටයුතු ආරම්භ කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.144/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සම්ප්‍රදායික කර්මාන්ත සංවර්ධනය කිරීම,— අම්පාර දිස්ත්‍රික්කයේ අභාවයට යන සම්ප්‍රදායික කර්මාන්ත වන අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය, කුඹල් කර්මාන්තය, තල් කොළ හා පන් ගස්වලින් පෙට්ටි, වට්ටි හා පැදුරු විවීම, කොහු කර්මාන්තය හා වේවැල් කර්මාන්තය යනාදිය සංවර්ධනය කර, එම ප්‍රදේශයේ ජනතාවට රැකියා අවස්ථාවන් උදාකර දීමෙන් ඔවුන්ගේ ආදායම නංවාලීමට රජය කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.146/'11

ගරු තිලංග සුමතිපාල මහතා,— ආයුධ වෙළඳාම සඳහා විධිමත් පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීම,—ජාත්‍යන්තර වශයෙන්, කිසිදු පාලනයකින් තොරව ආයුධ වෙළඳාම ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව වැනි රටවලට ආයුධ ගලා ඒම සහ එම රටවල් තුළ අවිධිමත් ලෙස ආයුධ සංසරණයවීම, ජනසමාජයේ නිදහසට ඉමහත් බාධකයක් ද ප්‍රජාතන්ත්‍රවාදී ලෙස බලයට පත් රජයකට තර්ජනයක් හා බලපෑමක් මෙන්ම රට තුළ මත්ද්‍රව්‍ය සහ ගණිකා වෘත්තිය වැනි නීති විරෝධී ක්‍රියාකාරකම් පුළුල් වීම සඳහා හේතුවක්ද වී ඇත. ඉහත තත්ත්වය වළක්වාලමින් විනයගරුක, නීතිගරුක සහ සදාචාර සම්පන්න සමාජයක් ජනිත කිරීම මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි අපේක්ෂාවක් වන බැවින් ද, වර්තමාන ලෝකයේ බලාපොරොත්තුව අවි වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම මගින් සමාජ අරගල අවම කර සමාජ සුභ සාධනය සහතික කිරීම වන බැවින් ද, මෙම විෂමාචාරයන් පිටුදැකීම සඳහා ජාත්‍යන්තර ගිවිසුම්වලට හා ප්‍රඥප්තිවලට අදාළව දේශීය නීති පද්ධතියක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.147/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— රට ඉඳි වගාව හඳුන්වාදීමේ හැකියාව විමසා බැලීම සඳහා පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම,— රට ඉඳි ශාඛය (ෆීනික්ස් ඩැක්ටිලිෆෙරා) අප රටේ වගා කිරීම සම්බන්ධයෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩිහි සිදු කරන ලද අත්හදා බැලීමක් සාර්ථක බව පෙනී ගොස් ඇති හෙයින්, අප රටේ ජනතාවට අපේම පොළවේ වවන ලද මෙම රසවත් පළතුර භුක්ති විඳීමට අවස්ථාව සලසනු පිණිස, රට ඉඳි වගාව හඳුන්වා දීමේ හැකියාව විමසා බලන පුළුල් අධ්‍යයනයක් සිදු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.151/'11

ගරු රවී කරුණානායක මහතා,— ගුවන් විදුලි විකාශ නියාමනය කිරීම,— ගුවන් විදුලි විකාශ නියාමනය කිරීමේ ස්වාධීන අධිකාරියක් සංස්ථාගත කිරීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.152/'11

ගරු රවී කරුණානායක මහතා,— රූපවාහිනී වැඩසටහන් විකාශය නියාමනය කිරීම,— රූපවාහිනී වැඩසටහන් විකාශය නියාමනය කිරීමේ ස්වාධීන අධිකාරියක් සංස්ථාගත කිරීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.153/'11

ගරු රවී කරුණානායක මහතා,— මහ නගර සභාවලට රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා හඳුන්වා දීම,— 2013 ජනවාරි මස 01 වැනි දින වන විට සෑම මහ නගර සභාවකම රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා පිහිටුවීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.154/'11

ගරු රවී කරුණානායක මහතා,— හිමිකම් පනත සම්මත කිරීම,— මානව අභිමානය, සමානාත්මතාව සහ නිදහස යන ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් තහවුරු කරන දකුණු අප්‍රිකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම වන හිමිකම් පනත හා සමානව රටේ සියලු ජනතාවගේ හිමිකම් සහතික කරමින් එම පනතේ නිශ්චිතව දැක්වෙන සීමාවන්ට යටත්ව රාජ්‍යය විසින් ඒවා ගරු කළ යුතු, ආරක්ෂා කළ යුතු, ප්‍රවර්ධනය කළ යුතු හා ඉටුකර දිය යුතු බවට විධිවිධාන සලස්වන පනතක් ශ්‍රී ලංකාවේ සම්මත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.155/'11

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශේෂ දීමනා ගෙවීම,— රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් අනුමත කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවහොත් හැර කිසිදු අමාත්‍යවරයෙකුට, නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කිසිදු විශේෂ දීමනාවක් නොගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.158/'12

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ වරායන් සංවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාව භූගෝලීය වශයෙන් වාසිදායක ආකාරයට ස්ථානගත වූ කේන්ද්‍රස්ථානයක පිහිටා ඇති බවට ප්‍රචලිතව තිබීමත්, පුරාතනයේ සිටම නැව් ප්‍රවාහන සේවය ඉතා වැදගත් සේවා කර්මාන්තයක් වීමත් සහ ඉන්දියාව ඉතාම අධිෂ්ඨානශීලීව වරායන් සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීමෙහි නිරතව සිටීමත් නිසා අප ඉන්දියාව සහ ඉන්දීය ව්‍යාපාර සමග එක් වී දෙරටේම යහපත පිණිස වරායන් සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.